**ශ්‍රේණිය:- 10 ශ්‍රේණිය- නර්තනය**

**පාඩම :- චරිත ස්වභාවය ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය**

ජීවත් වීමේදී අපට විවිධ චරිත සමඟ සම්භන්ධ වී කටයුතු කිරීමට සිදුවේ.

ඒ අතර,

1.මිනිස් චරිත (මහලු චරිත, යාචක චරිත,
සිහි මද ගති ඇති චරිත )



2.සත්ව චරිත
(හංස, මොනර, සිංහ)




3.මනඃකල්පිත චරිත
(සුරංගනාවන්, යක්ෂයන්)




මෙම චරිත හඳුනා ගැනීමට මුහුණේ මෙන්ම අඟ පසඟ වල හැඩතල මෙන්ම ඉරියව් ද බලපානු ලබයි. චරිත එකිනෙක වෙනස් වන්නේ මේවා මගිනි.

ඉහත සඳහන් කල චරිත උපයෝගී කර ගනිමින් නර්තන නිර්මාණය කිරීමේදී නර්තනයට අවශ්‍ය ආකාරයට අංගරචනය කරගත යුතුය.

වේශ නිරූපණයේ දී වැදගත් වන්නේ "නළල ඇස් නාසය කන් සහ අත් පා" ය. මෙම අංග චරිත හා හැඩතල උපයෝගී කර ගනිමින් අවශ්‍ය ආකාරයට හැඩ ගැන්වීම "අංග රචනය" යනුවෙන් හැඳින්වෙයි.

අංග රචනය කිරීමේදී මුහුණ මූලික වශයෙන් කොටස් හයකට බෙදා දැක්විය හැකිය.

1.නළල

2.ඇස්

3.නාසය

4.කට

5.කම්මුල්


6.නිකට



අංග රචනය කිරීමේදී විධි

අංග රචනය කිරීමේ ක්‍රම විධි කිහිපයකි.

1.ස්වභාවික අංග රචනය - කෙනකුගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කරන අංග රචනය



ස්වභාවික අංග රචනය

2.චරිතාංග අංග රචනය - බාහිර ස්වරූපය වෙනස් කර චරිතයට අවශ්‍ය පරිදි සකස් කර ගැනීම



චරිතාංග අංග රචනය

3.ශෛලිගත අංග රචනය - රැවුළු කොණ්ඩා සැරසීම ආදිය උපයෝගී කර ගනිමින් යම් ශෛලියක් අනුව කෙරෙන අංග රචනය



ශෛලිත අංග රචනය - 'මනමේ'

4.විකාරරූපී අංග රචනය - කෝලම් ආදී චරිත නිරූපණය සඳහා විහිලු විකාරරූපී අංග රචනය ද යොදා ගනී



විකාර රූපී අංග රචනය

ඇගයීම:-

1.අප ජීවත් වීමේදී අපට හමුවන චරිත බෙදා දැක්විය හැකි කාණ්ඩ නම් කර උදාහරණ දෙක බැගින් ලියන්න

2.එම චරිත හඳුනා ගැනීම සඳහා බලපාන ප්‍රධාන සාධක දෙකක් ලියන්න

3.වේශ නිරූපණයේදී වැදගත් වන අංග මොනවාදැයි ලියා දක්වන්න

4.අංග රචනය යන්න හඳුන්වන්න

5.අංග රචනය කිරීමේ ක්‍රම විධි කීයද? ඒ මොනවාද?


චරිතාංග අංග රචනයක් සිදුකරන අයුරු

චරිතාංග අංග රචනයට පෙර අංග රචන ශිල්පියා චරිතය පිළිබඳ මනා අවබෝධයක් ලබා තිබිය යුතු අතර තමාට අවශ්‍ය කරන චරිතය ඇති ඡායාරූප ,වීඩියෝ පට හොඳින් නිරීක්ෂණය කල යුතුය.

මහලු චරිතයක් අංග රචනය කිරීම.

මහලු චරිතය ඉස්මතු කර දැක්වීමේදී ප්‍රධාන තැනක් ගන්නේ එම චරිතය ඉදිරිපත් කරන්නාගේ මුහුණය.

පළමුව මුහුණ කොටස් කර ගත යුතුය .





1.අංග රචනයට මුලින්ම භාජනය කරනුයේ නළලය.(නළලේ රැළි ස්වභාවය)




2.වයස්ගත චරිතයක ඇස් නිර්මාණය කිරීමේදී පීඩාකාරී බව, ඇස් යට ගිය බව ,විඩාවට පත් බව පෙන්විය යුතුය. එනිසා ඇස් වටා අඳුරු කල යුතුය.





3.නාසය නිර්මාණය කිරීමේදී මුහුණට ගැලපෙන ආකාරයට නාසය මතුපිටින් හැඩ (ත්‍රිමාන /ද්විමාන) ඇඳ ගැනීමට පිළිවන.



4.කට නිරූපණය කිරීමේ දී දෙතොල සිහින් භාවයක් හා දුර්වර්ණ ස්වභාවයක් නිරූපණය කළ යුතුය . දත් වයස අනුව වර්ණ ගැන්විය යුතුය .කළු වර්ණය භාවිත කිරීමෙන් කටෙහි දත් නැති බව පෙන්විය යුතුය .




5.කම්මුල්- කම්මුල් වල ගැසුණු ස්වභාවයක් ගනියි. අඳුරු වර්ණ යෙදීමෙන් එය නිර්මාණය කරගත හැකිය.




6.නිකට - වයස්ගත පුද්ගලයාගේ නිකට මහතට එල්ලා වැටෙන ස්වභාවයක් දැකිය හැකිය.පොටි භාවිතයෙන් නිකටේ හැඩය විවිධ ආකාරයට වෙනස් කරගත හැකිය.



පොව් දමා හිකට වෙනස්කිරීම

කෘතිම රැවුල් යෙදීම

අංග රචනය සඳහා භාවිත කරන ද්‍රව්‍ය හා උපකරණ

* මූලික ආලේපන - pan cake(පදනම් ආලේපන )

* රේඛා ඇඳීම - lining colours අංග රචනයේ දී විවිධ හැඩ රූප වර්ණ මතු කිරීම සඳහා භාවිතා කරයි .

*ආලේපන පැන්සල් - (makeup  pencils ) රේඛා ඇඳීමටත් හැඩතල මතු කිරීමටත් භාවිත කළ හැකිය .


*බුරුසු හා ස්පොන්ච් - (brushes and sponges) වර්ණ ආලේප කිරීමට හා බේස් පවුඩර් ආලේප කිරීම සඳහා


*පවුඩර් (powder )- මේකප් කිරිමෙන් පසු සුළු වශයෙන් යොදයි. මෙමගින් දහඩිය දැමීමෙන් මුහුණේ ඇතිවන දිලිසෙන ස්වභාවය නැතිකර ගත හැකිය.

*දත් වර්ණය (Tooth Enamels) දත් වර්ණ කිරීම සඳහා භාවිතා කරයි .

*Removing cream - මුහුණේ මේකප් ඉවත් කිරීම සිදුකරයි .


*මීට අමතරව eyeshadows lipstick eyelashes (කෘතිම ඇහි පිහාටු)








පදනම් ආලේපන (කැට)


පදනම් ආලේපන (ෟරු)




අයිබ්‍රෝ පෙන්සිල්



පුයර




ස්පොන්ජස්





ටූත් එනමල්




කෘත්‍රිම ඇසි පිහාටු





බ්ලෂර්




පොටි



[illegible]

| | |
|---|---|
|  බ්‍රෂ් |  පිරිසිදු විලේපනය |
|  අක්ෂි ඡායා |  තොල්කූරු |

ඇගයීම:-

1.අංග රචනය කිරීමට පෙර අංගරචන ශිල්පියා විසින් කළ යුතු දේවල් දෙකක් ලියන්න

2.චරිතයක් ඉස්මතුකර දැක්වීමේදී ප්‍රධාන තැනක් ගන්නේ ශරීරයේ කුමන ස්ථානය ද ?

3.අංග රචනයේ දී මුහුණ කොටස් කීයකට බෙදේද?

ඒ මොනවාද ?

4.අංග රචනයට මුලින්ම භාජනය කරනුයේ මුහුණේ කුමන කොටසද?

5.නාසය නිකට ආදිය වෙනස් කිරීම සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය මොනවාද?

6.අංග රචනය සඳහා භාවිත කරන ද්‍රව්‍ය පහක් ලියන්න.